# අපූරු පාඩම



ඔමෙත්මා සෙෂ්මි හේරත්

# අපූරු පාඩම

කර්තෘ ප්‍රකාශනයකි
පළවන මුද්‍රණය 2025 පෙබරවාරි 08

කතාව සහ චිත්‍ර
ඔමෙත්මා සෙෂ්මි හේරත්
2 ශ්‍රේණිය **B**
මහ / මහාමායා බාලිකා විදුහල

978-624-208-594-4

# පිදුම

මාගේ ආදරණීය
අම්මාටත් අප්පච්චිටත්
පාසලේ ආදරණීය
විදුහල්පතිනිය ඇතුළු
ගුරු මෑණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්
මාගේ ආදරණීය අකුරු
කරන සොයුරියන්ටත්
මෙම කතා පොත
ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටම සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමන්විතවීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමියන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන් අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකෝමත් එක කැළයක ගිරා රංචුවක් හිටියා.



එක දවසක් මේ ගිරා රංචුව
කෑම හොයාගෙන යද්දි අඹ
ගෙඩියක් ගසක තියෙනවා
දැක්කා.



නියඟයක් උදාවුණා. හැමෝටම
කෑම නැති වුණා.



රංචුවේ තනියම ඉන්න ගිරවාට
පේර ගෙඩියක් හම්බුණා.



මේ පේර ගෙඩිය තනියම කනවා නායක ගිරවා දැක්කා. නායක ගිරවාට හොඳටම තරහ ගියා.



මේ ගැන ගිරා රංචුවේ හැමෝටම කියන්න නායක ගිරවා කල්පනා කළා.



අනිත් ගිරවුන්ට නායක ගිරවා
මේ ගැන කිව්වා. තනියම
ඉන්න ගිරවාට පාඩමක්
උගන්වන්න ඕන කියලා ගිරවු
යාළුවෝ කතා වුණා.



නායක ගිරවා මේ ගිරවා
රංචුවෙන් එලවා දැම්මා.
තනියම හිටිය ගිරවාට
ගොඩාක් දුක හිතුණා.



ගිරවා තනිවුණා. කිසිම කෑමක් බීමක් කන්නේ නැතිව අඬ අඬා කාලය ගත කළා.



තනි උන ගිරවා නායක ගිරවා ළඟට ගිහින් සමාව ගත්තා. කිසිම දවසක තනියම කන්නෙ නැහැ කියලා පොරොන්දු වුණා.



ඊට පස්සේ කිසිම දවසක මේ
ගිරවා යාළුවන්ට නොදී කිසිම
දෙයක් කෑවේ නැහැ. හැමදේම
බෙදාගෙන කාලා ගිරා යාළුවොත්
එක්ක සතුටින් කාලය ගත කළා.
නායක ගිරවා දුන් දඬුවම නිසා
අනිත් යාළුවොත් අපූරු පාඩමක්
ඉගෙන ගත්තා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යමය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක



දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනි තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර් යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්